කුරහන් හේන

ජී. එච්. පෙරේරා කිවිඳුන් විසින් රචිත
කුරහන් හේන පද්‍යාවලියෙනි....

මුලදී කැලේ හැටි බැලුවම කුමක් වැනී
පිහිය නුදුටු අපේ මාමගේ රෑවුල වැනී
හේන කොටා ගිනි තිබ්බම කුමක් වැනී
බඳින දවෙස එළි කළ මගේ මූණ වැනී

කුරක්කනේ පොඩි පැළපත කුමක් වැනී
විසි වයසේ කම්මුලේ පෙනුම වැනී
පීදීගෙන එන කුරහන් කුමක් වැනී
අලුත් ළමිස්සියකගේ මල් සිනා වැනී

බණ්ඩි කුරහන් පැද්දෙනු කුමක් වැනී
පොඩි නෑනා දුර සිට අත වනනු වැනී
කිරය නැමුණු විට කුරහන් කුමක් වැනී
පෝරුව උඩ මනමාලිගෙ ඔළුව වැනී

පැසී තිබෙන රතු කුරහන් කුමක් වැනී
මඟුල් ළඟදි නෑනා ඉස් වනනු වැනී
කරල් කපා මලු පුරවනු කුමක් වැනී
අතිරස උයා මඟුලට එක් කරනු වැනී

කැපූ කුරක්කන් ගෙන යනු කුමක් වැනී
මනමාලිය කැන්දා ගෙන යන්න වැනී
වණ්ඩුව බැඳ තැනූ පිට්ටුව කුමක් වැනී
මිරිස වැටිය අව්වට දිලිසෙනා වැනී

ගමරාළගේ කට එතකොට කුමක් වැනී
වළාකුළෙන් මතුවී එන සඳක් වැනී
එක දැකපු කම්මැලි කට කුමක් වැනී
කරත්තයට අසුවුණු කජු ලෙල්ල වැනී